// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2149/18 - 2019 නොවැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

5 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියමය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියමය මගින් එම වගන්තිය යටතේ 2017 පෙබරවාරි 21 දිනැති අංක 2007/24 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 1465/20 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමය එහි උපලේඛනයේ 35 වැනි අයිතමයට ඉක්බිතිව පහත දැක්වෙන නව අයිතමය එකතු කිරීම මගින් සංශෝධනය කරමි.

"36. රජය විසින් හෝ රජය වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින් හෝ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතිය යටතේ ස්ථාපනය කරන ලද නාගරික සංවර්ධන අධිකාරිය විසින්, යම් ඉඩමක් කල් බදු දීමේදී, රජය පාර්ශවයක් වන ගිවිසුමකට අනුව බදු ගැණුම්කරු විසින් කල් බදු වාරික ගෙවීම සහ/හෝ බදු කුළිය/ප්‍රතිෂ්ඨාව අදාළ වන පරිදි, රජයට හෝ එකී නාගරික සංවර්ධන අධිකාරියට මුදලින් ගෙවිය යුතු නොවන අවස්ථාවක, එකී කල් බදු දීමට අදාළ සාධන පත්‍රය."

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

11 - 1642

1A - G 31456 — 67 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*